ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය - 2017
---------------------------------------------------

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනතේ 51(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම
-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මත සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

රජයෙන් හා වෙනත් ව්‍යාපෘති වලින් ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන යොදා ගනිමින් පිරිවැය රු.707,807,391 කට මිලදී ගත් ස්ථාවර වත්කම් වාර්ෂිකව ක්ෂය කරන නමුත් එම ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කර ගිණුම්වලට ගැනීමේ ප්‍රතිපත්තියක් විශ්වවිද්‍යාලය විසින් හඳුනාගෙන නොතිබුණි. කෙසේවෙතත් සමාලෝචිත වර්ෂයේ සිට ප්‍රාග්ධන ප්‍රදානවලින් මිළදී ගත් වත්කම් හඳුනාගෙන ඊට අදාළ ක්ෂය ප්‍රමාණයට සමාන වටිනාකමෙන් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙන් විලම්භිත ආදායම් ලෙස කාර්යසාධන ප්‍රකාශනයට ගලපා තිබුණි.

**2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රමිතයෙහි 21 ඡේදයට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි සහ වාහන අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා දරන ලද පිළිවෙලින් රු.1,681,850 ක සහ රු.1,042,461 ක වියදම් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) ප්‍රමිතයෙහි 47 ඡේදය ප්‍රකාරව, දේපල පිරියත හා උපකරණ අයිතමවල සාධාරණ වටිනාකම සැලකිය යුතු තරමේ වෙනස්වීම් වන විට ප්‍රත්‍යාගණනයක් කළ යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වටිනාකම රු. 491,051,777 ක් වූ දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

(ඈ) ප්‍රමිතයෙහි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 46,798,533 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණ ද තව දුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂවල ඉදිකිරීම් කොන්ත්‍රාත් වෙනුවෙන් රඳවා ගන්නා ලද රු. 723,062 ක් සමාලෝචිත වර්ෂයේ දී නිදහස් කර තිබුණද එය ආපසු ගෙවිය යුතු රැඳවුම් මුදල් ගිණුමට හර කිරීම වෙනුවට අදාළ වත්කම් ගිණුම් හර කිරීම හේතුවෙන් වත්කම් ගිණුම හා ආපසු ගෙවිය යුතු රැඳවුම් මුදල් ගිණුම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද නිදහස් කරන ලද මුදලින් රු. 188,540 ක් 2017 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු රු.2,006,144 ක රැඳවුම් මුදල් තුල ඇතුළත්ව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී ඉදිකිරීම් සඳහා අත්තිකාරම් වශයෙන් ගෙවන ලද රු. 30,480,475 ක් අත්තිකාරම් ගිණුම හර කිරීම වෙනුවට ගොඩනැගිලි ගිණුමට හර කර තිබීමෙන් ගොඩනැගිලි ගිණුම හා අත්තිකාරම් ගිණුම එම වටිනාකමින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මට්ටක්කුලිය ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඉදිකිරීමට යෝජිත පස් මහල් දේශනශාලා ගොඩනැගිල්ලේ ඇස්තමේන්තු සැකසීම වෙනුවෙන් 2016 වර්ෂයේදී ගෙවන ලද රු.6,126,550 ක මුදල හා පස් පරීක්ෂාව සඳහා ගෙවන ලද රු.331,132 ක මුදල කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට ගොඩනැගිලි හා ඉදිකිරීම් ගිණුම යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ඉදිකිරීම් කටයුතු අත්හැර දමා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට තංගල්ල විද්‍යාලයේ ඉදිවෙමින් පැවති වැඩහල් හා දේශන ශාලා ගොඩනැගිලි සඳහා ගෙවන ලද රු.1,604,783 ක මුදල හා වෙනත් ඉදි කිරීම් වෙනුවෙන් උපචිත වියදම් යටතේ දක්වා තිබුණු රු. 16,321,399 ක මුදල නොනිම් වැඩ යටතේ නොදක්වා ප්‍රාග්ධනිත කර තිබීම හේතුවෙන් රු. 17,926,182 කින් ගොඩනැගිලි හා ඉදිකිරීම් ගිණුම වැඩියෙන් හා නොනිම් වැඩ ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී ගිවිසුම්වලට එළඹී තිබුණු, ඉදිකිරීම් 02 ක ගිවිසුම් ගත වටිනාකම වූ රු.21,889,116ක් ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි හා ඉදිකිරීම් ගිණුම සහ උපචිත වියදම් ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. තවද, ගිවිසුම් ගත පරිදි එම ඉදිකිරීම් සිදු නොකිරීම හේතුවෙන් 2018 ජුනි 12 දින වටිනාකම රු.15,387,672 ක් වූ එම එක් එක් ඉදිකිරීමක ගිවිසුම ද අවලංගු කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී නිදහස් කරන ලද රු.200,000 ක ටෙන්ඩර් තැන්පතු, ආපසු ගෙවියයුතු ටෙන්ඩර් තැන්පතු ගිණුම හර කිරීම වෙනුවට ආපසු අයවියයුතු තැන්පතු ගිණුම හර කිරීම හේතුවෙන් ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ගිණුම හා ආපසු අයවිය යුතු ටෙන්ඩර් තැන්පතු ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂ 03 ක ගිණුම් විගණනය කිරීම වෙනුවෙන් වූ විගණන ගාස්තු සඳහා ගිණුම්වල වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

(ඖ) පෙර වර්ෂයේදී ගිණුම්වලින් ප්‍රතිපාදන සලසා නොතිබුණු, සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් වෙත ගෙවන ලද රු. 24,590,014 ක හිඟ වැටුපෙන් රු. 8,762,125 ක් ණයහිමි ගිණුමත් ඉතිරි රු. 15,827,889ක් උපචිත වියදම් ගිණුමත් හර කිරීම හේතුවෙන් එම ගිණුම් එම වටිනාකම්වලින් අඩුවෙන් දක්වා තිබුණි. තවද එම සදොස් ගිණුම්තැබීම හේතුවෙන් ණයහිමි ගිණුමේ ශේෂය රු. 8,153,444 ක හර ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට විශ්වවිද්‍යාලයට ලැබී නොතිබුණු භාණ්ඩ හා සේවා වටිනාකම රු.7,134,344 ක් උපචිත වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් උපචිත වියදම් ගිණුම එම වටිනාකමෙන් ද, ස්ථාවර වත්කම් ගිණුම රු.6,887,057 කින්ද,ලිපි ද්‍රව්‍ය මිලදී ගැනුම් ගිණුම රු.247,287 කින්ද මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) 2015 හා 2016 වර්ෂවලදී විශ්වවිද්‍යාලයේ පරිහරණය සඳහා මුදල් අමාත්‍යාංශයෙන් හා වෙනත් දෙපාර්තමේන්තුවකින් පවරා ගෙන තිබුණු වාහන හතරක වටිනාකම වූ රු.27,159,250 ක් හා ඊට අදාළ ක්ෂය ප්‍රතිපාදනය වූ රු. 6,789,812 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

2.2.4 අවිනිශ්චිත ගිණුම්

-------------------

මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ 2011 වර්ෂයේ සිට පැවත එන හඳුනා නොගත් රු. 85,433 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු උපාධි පාඨමාලා ගාස්තුව රු. 15,754,623 ක් වූ අතර ඒ තුල 2001 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ රු. 5,913,500 ක් හා 2015/2016 අධ්‍යයන වර්ෂයට අදාළව උපාධි හා අනෙකුත් පාඨමාලාවලින් අයවිය යුතු රු. 9,841,123 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිසුන්ගෙන් අයකර ගෙන නොතිබුණි. කෙසේ වුවත් 2017 වර්ෂයේ සිට සියලුම පාඨමාලා සඳහා විශ්වවිද්‍යාලය ගාස්තු අය නොකරන බැවින් මුළු මුදලම අය කර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය කෙරේ. පාඨමාලා ගාස්තු අය නොකිරීමට අදාළ විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) 2001 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව ඉදිරියට ගෙන එමින් පැවති ශිෂ්‍ය නේවාසික ගාස්තු රු. 798,671 ක් නේවාසික සිසුන් නේවාසිකාගාරවලින් පිටව ගොස් දීර්ඝ කාලයක් ගත වී තිබුණු බැවින් එම මුදල අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. තවද 2017 වර්ෂයේ සිට නේවාසික ශිෂ්‍යයන්ගෙන් මුදල් අය නොකිරීම හේතුවෙන් පසුගිය වර්ෂවලට අදාළව ලැබිය යුතුව තිබුණු ශිෂ්‍ය නේවාසික ගාස්තු වූ රු. 2,526,383 ක් ද ගෙවීම ශිෂ්‍යයින් විසින් පැහැර හැර තිබුණි. කෙසේවුවද ශිෂ්‍ය නේවාසික ගාස්තු අය නොකිරීමට අදාළ විධිමත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) නිලධාරින් 06 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු. 191,464 ක් වූ සුනාමි ණය ශේෂයක් පැවැති අතර එම නිලධාරීන් දැනට සේවයේ නොසිටින බැවින් අය කර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ඇ) 2015 වර්ෂය හා ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙන එන ලද රු.5,989,432 ක උපචිත වියදම් ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) **2002** වර්ෂයේ සිට **2013** වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල විවිධ සේවා ලබා ගැනීම වෙනුවෙන් නාරා (National Archives and Records Administration) ආයතනය වෙත තැන්පත් කරන ලද රු. **445,750** ක් ද Scuba Diving වැඩසටහන් සඳහා **2009** වර්ෂයේ සිට ලැබිය යුතු රු. **930,592** ක් ද පැවති අතර ඒවා අදාළ ආයතනය විසින් ගෙවිය යුතු ලෙස තහවුරු කර නොතිබුණි.

(ඊ) විගණන ගාස්තු රු. **67,247** ක් දීර්ඝ කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව ගිණුම්වල ඉදිරියට ගෙනවිත් තිබුණි.

**2.4** **නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **2014** සැප්තැම්බර් **07** දිනැති අංක **31** දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පනතේ, | |
| **10(1),13(1),18,24(1),28** වගන්ති | යොමුගත රෙගුලාසි ප්‍රකාරව කුලපතිවරයකු පත්කර නොතිබුණු අතර බලමණ්ඩල, ශාස්ත්‍රීය සභාව හා මණ්ඩප පිහිටුවීමට ද කටයුතු කර නොතිබුණි. |
| (ආ) **1958** අංක **15** දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ **47** වගන්තිය හා **2011** අප්‍රේල් **28** දිනැති අංක **955** දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | පනතේ හා චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාවට අමතරව ගෙවා ඇති අනෙකුත් දීමනාවලින් ද සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනය කර තිබුණු අතර ඒ හේතුවෙන් **2010** සිට **2012** ජූලි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව අරමුදල වෙත වැඩිපුර ප්‍රේෂණය කර තිබුණු මුදල රු. **777,342** ක් විය. තවද **2012** ජූලි මාසයට පසුවද වැඩිපුර ප්‍රේෂණය කරන ලද සේවක අරමුදල් වටිනාකම ගණනය කර ඉදිරියේ දී ගෙවනු ලබන දායක මුදලින් හිලව් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br><br>සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරීමේ දී වැටුප් සමග ගෙවනු ලබන අධ්‍යයන දීමනාව අදාළ කර නොගත යුතු වුවද විශ්වවිද්‍යාලය ඊට පටහැනිව කටයුතු කර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ **6.1** වගන්තිය | මාසික ඒකාබද්ධ වැටුප පදනම් කර ගෙන අතිකාල දීමනාව හා නිවාඩු දින වැටුප් ගණනය කළ යුතු වුවත්, දළ වැටුප පදනම් කර ගෙන අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 206 | සමාලෝචිත වර්ෂය තුල රු. 723,062 ක රුදවුම් මුදල් නිදහස් කිරීමේ දී රෙගුලාසියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 565 (2) | රෙගුලාසිය ප්‍රකාරව පොදු තැන්පත් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 570 , 571 හා 572 | වසර දෙක ඉක්ම වූ ආපසු ගෙවිය යුතු රු. 2,006,144 ක රුදවුම් මුදල් සම්බන්ධයෙන් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 835 | (i) ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා ගොඩනැගිලි 02 ක් බද්දට ගැනීම වෙනුවෙන් මූලික අත්තිකාරම් ලෙස රු. 1,650,000 ක් බදුකරුවන්ට ගෙවා තිබුණ ද ඒ සඳහා අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.<br><br>(ii) මූලික අත්තිකාරම් මුදල් ගෙවීමට අදාළ කොන්දේසි ඇටෝර්නි ජනරාල්වරයා විමසා උපදෙස් ලබා ගෙන ගිවිසුම්වලට ඇතුළත් කළ යුතු බව දක්වා තිබුණ ද ඉහත ගොඩනැගිලි සඳහා බදු ගිවිසුම්වලට එළඹීමේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි. තවද එම ගොඩනැගිලිවල ඇති භාණ්ඩ හා සවි කිරීම් පිළිබඳ ලැයිස්තු ද බදු ගිවිසුම්වලට ඇතුළත් කර නොතිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වර්ෂයේ ආරම්භක පිරිවැය රු. 31,211,626 ක් වූ හා සමාලෝචිත වර්ෂයේ දී මිලදී ගත් රු. 4,370,860 ක් වූ පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.21,768,782ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.81,951,775 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී රු. 103,720,557 ක වර්ධනයක් සිදු වී තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රදාන රු.72,161,000 කින් වැඩි වීම හා රජයේ ප්‍රදානවලින් රු. 47,915,337 ක් විලම්භිත ආදායම් වශයෙන් ගැලපීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 2 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් රු.55,500,835 ක හා රු.81,951,775 ක ඌනතාවයක් පැවතියද 2017 වර්ෂයේදී රු.21,768,782 ක අතිරික්තයක් විය. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2015 වර්ෂයේදී රු.120,958,811 ක් වූ විශ්වවිද්‍යාලයේ දායකත්වය 2017 වර්ෂයේදී රු.234,018,352 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතෙහි සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා උපාධි හා වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්වීම සහ ජංගම වැඩසටහන් මගින් ධීවර ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම විශ්වවිද්‍යාලය මගින් සිදු කර තිබුණ ද විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීමේදී ධීවර හා සමාන ක්ෂේත්‍රවල සේවක මඩුලු සඳහා වෘත්තීය හා තාක්ෂණික පාඨමාලා සැපයීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ආ) සිසුන් බඳවා ගැනීමේ හා පාඨමාලා පැවැත්වීමේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) උපාධිපාඨමාලා පැවැත්වීම

2017 / 2018 අධ්‍යයන වර්ෂය සඳහා විද්‍යාල 02 ක උපාධි පාඨමාලා 04 ක් සඳහා නවක සිසුන් බඳවා ගැනීම වර්ෂය අවසානය දක්වා ප්‍රමාද වී තිබුණු බැවින් අධ්‍යයන කටයුතු සමාලෝචිත වර්ෂය තුල ආරම්භ කර නොතිබුණි.

(ii) ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම

සමාලෝචිත වර්ෂයේ දී විද්‍යාල 06 ක ඩිප්ලෝමා පාඨමාලා 03 ක් සඳහා ඉලක්ක ගත කණ්ඩායම් සංඛ්‍යාව 12 ක් හා ශිෂ්‍ය සංඛ්‍යාව 194 ක් වුවද තත්‍ය වශයෙන් විද්‍යාල 06 ක කණ්ඩායම් 07 ක් සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය 144 ක් වුයෙන් පාඨමාලා පැවැත්වීමේ හා ශිෂ්‍ය ලියාපදිංචියේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 58 ක් හා සියයට 74 ක් විය. 2015 වර්ෂයේ දී මීගමුව විද්‍යාලයට බඳවා ගත් සිසුන් 29 දෙනෙකු ඩිප්ලෝමා පාඨමාලා සමාලෝචිත වර්ෂය තුල නිම කිරීමට නියමිත වුවත් එම පාඨමාලා නිම කර සහතික පත්‍ර ප්‍රදානය කර නොමැති බව, විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අනාවරණය විය.

(iii) සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම

Continues Discharge Certificate (CDC පාඨමාලා)

- වෙළඳ නැවක රැකියාවකට යාම සඳහා අවශ්‍ය අඛණ්ඩතා සහතිකපත් (CDC) පාඨමාලාව යටතේ මට්ටක්කුලිය හා තංගල්ල විද්‍යාල දෙකෙහි ඩෙක්රේටින් හා එන්ජින් රේටින් පාඨමාලා සඳහා 2015 අප්‍රේල් 07 සිට 2018 අප්‍රේල් 06 දක්වා වසර 03 කට වලංගු වන සේ ISO 9001 – 2008 තත්ත්ව සහතිකය ලබා ගෙන තිබූ අතර

එම සහතිකය ලබා ගැනීම වෙනුවෙන් දරන ලද වියදම රු. මිලියන 3 ඉක්මවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුල මෙම විද්‍යාල දෙකෙහි පාඨමාලා 02 වෙනුවෙන් කණ්ඩායම් 04 ක් සඳහා සිසුන් 120 ක් බඳවා ගැනීමට ඉලක්ක කර තිබුණ ද මට්ටක්කුලිය විද්‍යාලයේ පාඨමාලා දෙකක් සඳහා පමණක් සිසුන් 42 ක් බඳවා ගෙන තිබූ අතර තත්ත්ව සහතිකය ලබාගත් කාලය තුළ තංගල්ල විද්‍යාලයේ මෙම පාඨමාලා පවත්වා නොතිබුණි. මේ අනුව CDC කණ්ඩායම් බඳවා ගැනීමේ ප්‍රගතිය සියයට 50 ක් හා සිසුන් බඳවා ගැනීමේ ප්‍රගතිය සියයට 35 ක් බව විගණනයේ දි නිරීක්ෂණය විය.

- මට්ටක්කුලිය විද්‍යාලයේ CDC පාඨමාලා නිම කර සහතික පත්‍ර ලබා ගෙන ඇති ශිෂ්‍ය සංඛ්‍යාව 33 ක් වූ අතර තත්ත්ව සහතික ලබා ගැනීමට දරන ලද වියදමට සාපේක්ෂව සැලකිය යුතු ඵලදායීතාවයක් ලබා ගෙන නොතිබුණු බව විගණනයේ දි නිරීක්ෂණය විය.

**(iv) National Vocational Qualification (NVQ පාඨමාලා)**

- සමාලෝචිත වර්ෂය තුල NVQ පාඨමාලා 07 ක් යටතේ විද්‍යාල 08 හි කණ්ඩායම් 30 ක් වෙනුවෙන් ශිෂ්‍යයින් 534 ක් බඳවා ගැනීමට ඉලක්ක කර තිබුණ ද, විද්‍යාල 05 ක පාඨමාලා 07 ක් යටතේ කණ්ඩායම් 15 ක් සඳහා ශිෂ්‍යයින් 202 ක් පමණක් ලියාපදිංචි වී තිබුණු බව අනාවරණය විය. මේ අනුව කණ්ඩායම් බඳවා ගැනීමේ ප්‍රගතිය සියයට 50 ක් හා ශිෂ්‍ය ලියාපදිංචියේ ප්‍රගතිය සියයට 38 ක් වැනි අඩු අගයක් ගෙන තිබුණි.

- NVQ මට්ටමේ පාඨමාලා 10 ක් සඳහා ලියාපදිංචිව සිටි ශිෂ්‍යයින් 78 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේ දී සහතික පත්‍ර ලබා දී තිබුණි. කෙසේ වුවද මෙම පාඨමාලා 10 ආරම්භයේ දී (2016 හා 2017 ) ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 129 ක් වූයෙන්, පාඨමාලා හැරගිය ශිෂ්‍ය සංඛ්‍යාව 51 ක් වූ අතර එය ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 40 කි.

**NON NVQ පාඨමාලා**

NON NVQ පාඨමාලා 08ක් සඳහා විද්‍යාල 08 හි ශිෂ්‍යයින් 440 ක් බඳවා ගැනීමට ඉලක්ක කර තිබුණ ද, තත්‍ය වශයෙන් විද්‍යාල 08 හි පාඨමාලා 05 ක් සඳහා බඳවා ගෙන තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාව 222 ක් හෙවත් සියයට 50 ක් විය.

**(ඇ) විද්‍යාල වශයෙන් පාඨමාලා පැවැත්වීම හා ශිෂ්‍ය ලියාපදිංචිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.**

විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ අන්තර්ග්‍රහණ කාර්යයන් නිම නොකිරීම, උපදේශකවරුන් බඳවා නොගැනීම සහ සිසුන් බඳවා ගැනීම සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන් නිසි පරිදි සන්නිවේදනය නොවීම හේතුවෙන් පාඨමාලා සඳහා අයදුම් නොකිරීමත් හේතුවෙන් විද්‍යාලවල ප්‍රගතිය පහත පරිදි දුර්වල මට්ටමක පැවැතුණි.

(i) තංගල්ල විද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලා 02 ක් සඳහා සිසුන් 27 ක් ද, ඩෙක්රේටින් හා එන්ජින් රේටින් (CDCපාඨමාලා) පාඨමාලා 02 ක් සඳහා සිසුන් 40 ක් ද බඳවා ගැනීමට සැලසුම් කර තිබුණ ද කිසිදු ශිෂ්‍යයකු බඳවා ගෙන නොතිබුණු අතර සිසුන් 45 ක් බඳවා ගැනීමට සැලසුම් කළ සහතික පත්‍ර පාඨමාලා 03 ක් ද පවත්වා නොතිබුණි.

(ii) මීගමුව විද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලා 02 ක් ද, NVQ පාඨමාලා 05 ක් ද පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද පවත්වා තිබුනේ එක් ඩිප්ලෝමා පාඨමාලාවක් හා NVQ පාඨමාලා 02 ක් පමණි. කෙසේ වුවද සමස්තයක් ලෙස මීගමුව විද්‍යාලයට සමාලෝචිත වර්ෂයේ බඳවා ගැනිමට සැලසුම් කළ ශිෂ්‍ය සංඛ්‍යාව 125 ක් වුවද ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 96 ක් විය.

(iii) මඩකලපුව විද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීමට සැලසුම් කර නොතිබුණ ද එක් ඩිප්ලෝමා පාඨමාලාවක් සිසුන් 22 කගේ සහභාගීත්වයෙන් පවත්වා තිබුණු අතර සැලසුම් කරන ලද NVQ පාඨමාලා 04 ක් පවත්වා නොතිබුණි. සමස්තයක් ලෙස සමාලෝචිත වර්ෂය තුල අධ්‍යයනය ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 70 ක් විය.

(iv) කළුතර විද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලා 03 ක් සඳහා සිසුන් 45 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබුණ ද ඩිප්ලෝමා පාඨමාලා 02 ක් සඳහා ශිෂ්‍යයින් 15 ක් පමණක් බඳවා ගෙන තිබුණි.

(v) ත්‍රිකුණාමලය විද්‍යාලයේ සමාලෝචිත වර්ෂය තුල ඩිප්ලෝමා පාඨමාලා කිසිවක් පැවැත්වීමට සැලසුම් කර නොතිබුණු අතර ශිෂ්‍යයින් 90 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබුණු NVQ සහතික පත්‍ර පාඨමාලා 04 ක් සඳහා කිසිදු ශිෂ්‍යයකු බඳවා ගෙන නොතිබුණි. තවද වර්ෂය තුල සැලසුම් කර තිබුණු සහතික පත්‍ර (NON NVQ) පාඨමාලාවක් සඳහා සිසුන් 16 ක් ද, සැලසුම් කර නොතිබුණු සහතික පත්‍ර (NON NVQ) පාඨමාලාවක් සඳහා සිසුන් 15 ක් ද බඳවා ගෙන තිබුණු නමුත් එම පාඨමාලා 2 හි පාඨමාලා කාලය සති 02 කටත් වඩා අඩු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව සමාලෝචිත වර්ෂයේ දී හිඟ සේවක අර්ථසාධක අරමුදල් ගෙවීමේ දී සේවකයාගේ දායකය වූ රු. 2,039,472 ක මුදල විශ්වවිද්‍යාලය මඟින් ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී රු. 2,936,012 ක අධිභාරයක් ගෙවීමට ද විශ්වවිද්‍යාලයට සිදු වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කාර්යාලය ඇතුළුව ප්‍රාදේශීයව පිහිටි විද්‍යාල 08 ක ඉඩම් හා ගොඩනැගිලි සහ අනෙකුත් වත්කම් වල අයිතිය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

-----------------------------------

ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා ඉදිකිරීම් සංවර්ධන කටයුතු සඳහා ලබා දී තිබුණු රු. මිලියන 60.75 ක ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු. මිලියන 21.64 ක් හෙවත් සියයට 36 ක් උපයෝජනය කර නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ දී රු. මිලියන 14 ක් වැය කර ඉදි කරන ලද මඩකලපුව සංචාරක නිවාසය සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 07 ක් වටිනා ලී බඩු උපකරණ ද සපයා තිබුණි. කෙසේ වුවද

එම ගොඩනැගිල්ල ඉදි කර වසර 04 ක් ගත වී තිබුණ ද එය 2018 අප්‍රේල් 30 දින දක්වාම භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන වාර්තාවලට අනුව විශාල ප්‍රමාණයේ ධීවර යාත්‍රා 07 ක් ද, කුඩා ප්‍රමාණයේ යාත්‍රා 05 ක් ද, අධිවේගී ධීවර යාත්‍රා 01 ක්ද විශ්වවිද්‍යාලය සතුව පැවතුණු අතර ඉන් අධිවේගි යාත්‍රාව හා විශාල ප්‍රමාණයේ ධීවර යාත්‍රා 05 ක් ද, කුඩා ප්‍රමාණයේ යාත්‍රා 01 ක් ද පසුගිය වර්ෂ කීපයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

**4.5** කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට විශ්ව විද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 327 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 188 ක් වූයෙන් පුරප්පාඩු 139 ක් පැවතුණි.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු ස්ථිරව පිරවීමට කටයුතු නොකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් හා දෛනික පදනම මත නිලධාරීන් 15 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විශ්වවිද්‍යාලයේ බඳවා ගැනීම් පරිපාටිය සකස් කර නොතිබුණු අතර එදිනට ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සේවකයින් විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණ කිරීමේ කටයුතු ද අවසන් කර නොතිබුණි.

(ඇ) තංගල්ල විද්‍යාලයේ සේවයේ නියුතු කථිකාචාර්ය තනතුරක් දරන නිලධාරිණියක් 2016 පෙබරවාරි 22 දින සිට 2019 පෙබරවාරි 28 දින දක්වා විදේශ ශිෂ්‍යත්වයක් සඳහා දිවයිනෙන් බැහැර ගොස් තිබුණි. කෙසේ වෙතත් එම නිලධාරිණිය දිවයිනෙන් බැහැර යාමට ප්‍රථම සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු අනුමත කර ගෙන නොතිබුණු අතර ඇප බැඳුම්කර හා ගිවිසුම් වලට ද එළඹී නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද ඇයට 2016 මාර්තු හා අප්‍රේල් මාසවලට අදාල වැටුප් වශයෙන් රු. 125,870 ක්ද ගෙවා තිබුණු අතර එම මුදල නැවත අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

**4.6** වාහන උපයෝජනය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සතු වාහන 29 න් වාහන 08 ක් දීර්ඝ කාලයක් තිස්සේ ගර්හිත තත්ත්වයේ පැවතුණු අතර එම වාහන සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 හා 2017 වර්ෂවලදී වාහන 4 කට සිදුව තිබූ අනතුරුවලට අදාල අළුත්වැඩියා කටයුතු සඳහා රු. 716,928 ක් වැය කර තිබුණ ද රක්ෂණ සමාගම් මඟින් ප්‍රතිපූරණය කර තිබුණු වටිනාකම රු.548,000 ක් වූයෙන් රු. 168,928 ක අලාභයක් සිදු වී තිබුණි.

**5.** තිරසාර සංවර්ධනය

------------------------

**5.1** තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනිම

----------------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර ඒ සඳහා 2017 ඔක්තෝබර් 03 දිනැති 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත සම්මත කර චක්‍රලේඛ මඟින් සියළු රජයේ ආයතන දැනුවත් කර තිබුණි. ඒ අනුව, තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ සියළුම රාජ්‍ය ආයතන දැනුවත් විය යුතු වුවද, විශ්වවිද්‍යාලය ඒ සම්බන්ධයෙන් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එකී කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

### 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය
--------------------------------------------

#### 6.1.1 ප්‍රසම්පාදනයන්
------------------

විශ්වවිද්‍යාලයේ උපාධි පාඨමාලා පැවැත්වීම සඳහා අවශ්‍ය දේශනශාලා, විද්‍යාගාර, පරිගණක විද්‍යාගාර, පුස්තකාල යනාදී පහසුකම් සැලසීමේ අරමුණින් මසකට බදු කුලිය රු. මිලියන 2.3 ක් බැගින් වසර දෙකක් සඳහා ගොඩනැගිල්ලක් බදු පදනමට ලබා ගැනීමට හා එම ගොඩනැගිල්ලේ අභ්‍යන්තර බෙදා වෙන් කිරීම් සඳහා රු. මිලියන 22.56 ක් ලෙස එකතුව රු.මිලියන 77.76 ක් වූ ගිවිසුම් දෙකකට 2017 දෙසැම්බර් 26 දින එළඹ තිබුණු අතර බදු ගිවිසුමේ කොන්දේසි අනුව මෙම ගොඩනැගිල්ලේ බදු කාලය තවත් වසර දෙකක කාලයකට දීර්ඝ කිරීමට ද බදු කරු එකඟ වී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 6 (2) (1) වගන්තිය ප්‍රකාරව අදාළ අමාත්‍යවරයා විසින් මේ සඳහා වන ලිඛිත විධානයක් විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය වෙත ලබා දී නොතිබුණු අතර මේ සඳහා ශක්‍යතා අධ්‍යයනයක් ද කර නොතිබුණි.

(ii) පාලක මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණේ 2017 සැප්තැම්බර් 18 දින වුවද ගොඩනැගිල්ල කුලියට ලබා ගැනීම සඳහා වන පළමු ප්‍රසම්පාදන දැන්වීම 2017 ජූලි 06 දින පුවත්පත්වල පලකර තිබුණි. එසේ වුවද ලංසු හැඳින්වීමේ ඡේදයේ හා ලංසු කොන්දේසි ඡේදයේ විස්තර එකිනෙකට පරස්පර ලෙස දක්වා තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන දැන්වීමේ වැරදි නිවැරදි කිරීම සඳහා 2017 ජූලි 17 දින දෙවන වරට දැන්වීම පල කිරීම සඳහා රු. 83,720 ක අමතර වියදමක් දරා තිබුණි.

(iii) බදු ගිවිසුමට අනුව ගිවිසුම් ගත මුදලින් සියයට 50 ක් වන රු. මිලියන 27.6 ක අත්තිකාරම් මුදලක් 2017 දෙසැම්බර් 27 දින ගෙවා තිබුණි. මෙම ගෙවීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ට අනුකූල නොවීය.

(iv) වසර හතරක කාලයක් සඳහා ලබා ගන්නා මෙම බදු ගොඩනැගිල්ල වෙනුවෙන් බදුකුලී හා අභ්‍යන්තර බෙදා වෙන් කිරීම් වියදම දළ වශයෙන් රු. මිලියන 147.70 ක් වන බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හා අතිරේක 33 පරිදි මෙම කාර්ය අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවක් විසින් සිදු කළ යුතු වුවත් ඊට පටහැනිව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මඟින් තීරණ ගැනීම් සිදු කර තිබුණි.

(v) ලංසු කොන්දේසි අනුව ගොඩනැගිල්ලේ සම්පූර්ණ බිම් ප්‍රමාණය වර්ග අඩි 25,000 ක් හෝ ඊට වැඩිවිය යුතු බව දක්වා තිබුණ ද ගොඩනැගිල්ල වර්ග අඩි 22,300 (දළ වශයෙන්) සමන්විත මහල් 03 කින් යුත් ගොඩනැගිල්ලක් බව 2018 ජූලි 09 දින කරන ලද භෞතික විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(vi) මෙම ගොඩනැගිල්ල බද්දට ගැනීමේ දී අත්තිකාරම් ලෙස ගෙවන ලද රු. 27,600,000 ක් සඳහා මුදල් රෙගුලාසි 835 (1) (ඇ) ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(vii) බදු ගිවිසුම අනුව වෘත්තීය ගාස්තුව, මුද්දර ගාස්තුව හා ලියාපදිංචි ගාස්තු වූ එකතුව රු. 833,000 ක මුදල දෙපාර්ශවය අතර සම සමව දැරිය යුතු වුවත් විශ්වවිද්‍යාලය විසින් අදාළ නීතීඥවරයාට රු.623,500 ක් ගෙවීම හේතුවෙන් රු. 207,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(viii) මෙම ගොඩනැගිල්ල පිහිටි සම්පූර්ණ ඉඩමේ ගොඩනැගිල්ල පිහිටීමත් අවට පරිසරයේ ඉඩ පහසුකම් නොමැති වීමත් හේතුවෙන්, විශ්වවිද්‍යාල සිසුන්ට සුදුසු වාතාශ්‍රය සහිත පරිසරයක් නොවූ බව නිරීක්ෂණය විය.

(ix) උපාධි පාඨමාලා පැවැත්වීම සඳහා වසර 04 ක කාල පරිච්ඡේදයක් වෙනුවෙන් බද්දට ගන්නා ලද මෙම ගොඩනැගිල්ල සඳහා දළ වශයෙන් රු. මිලියන 169.76 ක් දැරීමට සිදු වන බව නිරීක්ෂණය වූ අතර එම අවශ්‍යතාවය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් විශ්වවිද්‍යාලය විසින් ගෙන නොතිබුණි.

(x) බද්දට ගත් උක්ත ගොඩනැගිල්ල සඳහා ගිවිසුම් අත්සන් කර වසරක කාලයක් ගත වී තිබුණ ද උපාධි පාඨමාලා සියල්ල ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේම පවත්වා තිබුණි. මේ අනුව ප්‍රධාන කාර්යාලයේ පාඨමාලා පැවැත්වීමට අවශ්‍ය ඉඩ කඩ පවතින බැවින් හා පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේ සැලකිය යුතු වර්ධනයක් සිදුනොවන බැවින් ද ඉහත ගොඩනැගිල්ල බදු ගැනීම අනාර්ථික ගනුදෙනුවක් බව නිරීක්ෂණය විය.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. මිලියන 49.5 ක් වූ කොන්ත්‍රාත් 04 කට අදාළ කොන්ත්‍රාත් ගිවිසුම් අනුව වැඩ නිම කළ යුතු කාලය අවසන්ව තිබුණ ද විගණිත දිනය වූ 2018 මැයි 10 දින වන විටත් එම ඉදිකිරීම් කාර්යයන් අවසන්ව නොතිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත් 02 ක 2018 මැයි 10 දිනට භෞතික ප්‍රගතිය සියයට 70 කට වඩා අඩු මට්ටමක පැවතුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරුවන් විසින් වලංගු කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර අධීක්ෂණ ඉංජිනේරුවරයාද ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණු බව ලිපිගොනු පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ii) බුස්ස විද්‍යාලයෙහි ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු කිරීම වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ඇස්තමේන්තු වටිනාකම රු. 18,148,219 ක ගිවිසුමකට 2017 දෙසැම්බර් 17 දින ඇතුළත් වී තිබුණු අතර 2018 ජූලි 17 දින අවසන් කළ යුතු මෙම ව්‍යාපෘතියේ කටයුතු 2018 ජූලි 17 දිනටත් ආරම්භ කර හෝ නොතිබුණි.

(iii) වටිනාකම රු. 13,380,585 ක් වැය කර මට්ටක්කුලියෙහි ඉදිකිරීමට යෝජිත වෙල්ඩින් වැඩහල 2018 අප්‍රේල් 04 දින අවසන් කිරීමට නියමිතව තිබුණ ද විගණිත දිනය වූ 2018 මැයි 10 දිනට ප්‍රගතිය සියයට 12 ක් විය.

කොන්ත්‍රාත්කරු විසින් එහි ඉදිකිරීම් කටයුතු නවතා තිබුණු බැවින් ඒ සඳහා නැවත මිල ගණන් කැඳවීමට සංශෝධිත ඇස්තමේන්තු සකස් කරන බව උපකුලපතිවරයා විසින් මේ සම්බන්ධයෙන් විගණනය වෙත දන්වා තිබුණි.

මේ අනුව රු. මිලියන **49.5** ක් වටිනා ඉදිකිරීම් **04**ක ප්‍රමාදය සම්බන්ධයෙන් ගිවිසුම් ගත කොන්දේසි හා ප්‍රසම්පාදන නියමයන් ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) **2015** වර්ෂයේ ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ රු. **27,646,398** ක් වැය කර ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ අඩුපාඩු ඉදිකිරීම් සිදුකළ කොන්ත්‍රාත්කරු මගින් ඉටු කරවා ගැනීම වෙනුවට යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ඉටුකරවා ගැනීම සඳහා රු. **2,147,737** ක පිරිවැයක් දරා තිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ගනුදෙනු හා ජර්නල් සටහන් නිවැරදිව ලෙජර් ගිණුම්වල සටහන් නොකිරීම, එකම ස්වභාවයේ හා එකම භාවිතයෙන් යුතු වත්කම් එකම වත්කම් පන්තියකට කාණ්ඩ නොකිරීම. |
| (ආ) වත්කම් කළමනාකරණය | වත්කම් නීත්‍යානුකූලව පවරා නොගැනීම හා වත්කම් ඌන උපයෝජිතව පැවතිම. |
| (ඇ) පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන්ව පවත්වා නොගැනීම. |
| (ඈ) ප්‍රසම්පාදනය | ගොඩනැගිලි බද්දට ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා මුදල් රෙගුලාසි අනුගමනය කර නොතිබීම. |
| (ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය | කාර්යමණ්ඩලයේ අන්තර්ග්‍රහණ කටයුතු නිසි පරිදි සිදු නොකිරීම හා පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම හේතුවෙන් සැලසුම්කළ පරිදි පාඨමාලා පැවැත්වීමට නොහැකිවීම. |
| (ඊ) මූල්‍ය පාලනය | වැය දැරීම සඳහා නිශ්චිත වැය විෂයයන් හා ප්‍රමාණයන් පිළිබඳ විද්‍යාල දැනුවත් කර නොතිබීම හේතුවෙන් ප්‍රධාන කාර්යාලයෙන් ගෙවීම් කළ හැකිව තිබූ බාහිර උපදේශක දීමනා හා අළුත් වැඩියා කිරීම් වැනි වියදම් සුළු මුදලින් කිරීම. |